# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2013 ජුලි මස 23 වන දින පෙ.ව 9 : 30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපිලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු උදේන විජේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පලාත්පාලන හා පලාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්‍ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/V/(01) 13/10)

(අ) මීරිගම ඩඩ්ලි සේනානායක ආදර්ශ කණිෂ්ඨ විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේදී අයථා බලපෑම් සිදුවී ඇති බව ඔබතුමා දන්නේද ?

(ආ) ඇතුලත් කිරීමේ සම්මුඛ පරීක්‍ෂණයකින් වැඩිම ලකුණු ලබාගත් දරුවන්ගෙන් 33 ක් හා අභියාචනා කරනා 02 ක්ද, ක්‍රියාන්විත රාජකාරියේ නියුක්ත අයගේ දරුවන්ගෙන් 07 දෙනෙකු ඇතුළුව 42 මූලිකව ඇතුලත් කරගන්නා බව පිළිගන්නේද ?

(ඇ) පන්තියකට 45 ක් සම්පූර්ණ කිරීමට ඉතිරි අය ඇතුලත් කරන්නේ වැඩිම ලකුණු ලබාගත් පදනම යටතේද,නැත්නම් වෙනත් ක්‍රමවේදයක් මගින්ද ?

(ඈ) මෙම විද්‍යාලයේ මූලික ඇතුලත් කිරීම් වලින් පසු පැවති පුරප්පාඩු 13 ක් සඳහා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් යොමු කල ලැයිස්තු දෙකකින් ළමුන් 09 දෙනෙකු ඇතුලත් කර ඇත්තේ කෙසේද ?

(ඉ) විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේදී වැඩිම ලකුණු හා පොරොත්තු ලේඛණ තුලින් ඇතුලත් කරගත් ළමුන්ගේ ලකුණු ප්‍රමාණයන් සඳහන් කරන්නේද ?

(ඊ) එම ළමුන් සම්මුඛ පරීක්‍ෂණ ලේඛණයට ඇතුලත්වී ඇත්ද? නැද්ද ?

(උ) වැඩිම ලකුණු යන පදනමට බැහැරව කටයුතු කිරීම ළමුන්ට කරන අසාධාරණයක් නොවන්නේද ?

(ඌ) එම අසාධාරණය සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක්ද ?

(එ) ඒ යටතේ වැරදි කරුවන්ට නීත්‍යානුකූලව දඬුවම් කිරීමට පියවර ගන්නේද ?

(ඒ) අසාධාරණයට ලක්වූ දරුවන්ට සාධාරණයක් ඉටුකරන්නේද ?

02. ගරු යූ. ජෝර්ජ් පෙරේරා – විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/V/(1) 13/11)

(අ) කැලණිය විවිධ සේවා සමුපකාර සමිතිය පුරා වසර 6 ක් තිස්සේ ඡන්දයක් නොපවත්වා සමුපකාර කොමසාරිස්තුමා නම් කල සභාපතිවරයෙකු යටතේ පාලනය වන බව පිළිගන්නේද ?

(ආ) මෙසේ පත්කර ඇති සභාපතිවරයා මෙම සමිතියේ සාමාජිකයෙක් නොවන බව පිළිගන්නේද ?

(ඇ) දේශපාලන හිතවත්කම් මත මෙම පත්වීම කර ඇති බව පිළිගන්නේ ද ?

(ඈ) මෙම සභාපතිවරයා යටතේ සමුපකාර සමිතිය තුල බරපතල මූල්‍ය අක්‍රමිකතා රැසක් සිදුව ඇති බව පිළිගන්නේද ?

(ඉ) දැනටමත් විවිධ පුද්ගලයින් හා සංවිධාන ඔස්සේ වාර්තා වී ඇති එකී වංචා හා දූෂණ පිළිබඳව යම් පියවරක් නොගන්නේ දේශපාලන හිතවත්කම් නිසා බව පිළිගන්නේද ?

(ඊ දිනෙන් දින පරිහානියට යන සමුපකාර සමිතිය ආරක්ෂා කර ගැනීමට අමාත්‍යවරයා වශයෙන් ඔබතුමා යම් පියවරක් ගන්නේද ?

(උ) නොඑසේනම් ඒ මන්ද ?

(ඌ) වසර 6 ක් තිස්සේ මෙම සමිතිය සඳහා ඡන්දයක් නොපැවැත්වූයේ මන්ද ?

(එ) ඉදිරියේදී හෝ ඡන්දයක් පවත්වන්නේද ? එසේනම් ඒ කවදාද ?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යංශ නිවේදනය / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. සභාවේ කටයුතු

ගරු සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව :

'අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගතයුතුය'

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 1) ගරු සිරිකමල් පිලිප්සන් ද සිල්වා මන්ත්‍රීතුමා :

"ශ්‍රී ලංකාව නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වන රටක් බව ප්‍රකාශිතය එහෙත් රට තුළ මධ්‍යම රජය, පළාත් සභා, පෞද්ගලික, ජාත්‍යන්තර, යනුවෙන් පාසැල් පද්ධතියක් ක්‍රියාත්මකව ඇති බව අපි දනිමු. මේ අතරින් බහුතර පාසැල් සංඛ්‍යාව ඇයත් වන්නේ පළාත් සභාවලටය. මෙම පළාත් සභාව වාර්ෂික අය වැය මගින් ප්‍රතිශතයක් ලෙස වැඩිම මුදල් ප්‍රමාණයක් වෙන් කරනු[1] ලබන්නේ ප්‍රධාන අමාත්‍යවරයා නියෝජන කරන අධ්‍යාපන අමාත්‍යාංශයටය. එහෙත් අප පළාතේ පාසැල් නඩත්තුව සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන මුදල ප්‍රමාණවත් නොවන බව බලධාරීන් විසින්ම ප්‍රකාශ කිරීම හේතුවෙන්, දෙමව්පියන්, ආදිසිසුන්, සුභ පතන්නන් හා වෙනත් විවිධ ක්‍රම මගින් විදුහල් වල අඩුපාඩු සකස්කර ගන්නා බව නොරහසකි. අවිධිමත් ලෙස සිදුවන මෙම ක්‍රියාවලිය නිසා දෙමාපියන්, සිසුන් පත් වන අපහසුතාවය මග හරවා ගැනීම සඳහා විධිමත් ක්‍රමෝපායක් කඩිනමින් සකස් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි."

(යෝ/v(01)13/02)

### 2) ගරු කීර්ති උඩවත්ත මන්ත්‍රීතුමා :

"වර්තමානයේ වාර්තා වන පරිදි ප්‍රාදේශිය දේශපාලනයේ සිට ජාතික දේශපාලන තලය දක්වා වූ මහජන නියෝජිතයන්ගේ ගුණාත්මකභාවය අතිශයින්ම පිරිහෙමින් පවතී. ඊට පිළියමක් වශයෙන් මැතිවරණ වලදී නාම යෝජනා ලබා දීමේදී දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන නාම ලේඛන විද්වත් මණ්ඩලයකට යොමු කොට එයින් නිර්දේශ වන නම් පමණක් පිළිගැනීමට මැතිවරණ කොමසාරිස් වෙත නියම කෙරෙන පරිදි නව නීති රීති සැකසිය යුතු බවට මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි."

(යෝ/v(01)13/03)

## XI. පොදු කටයුතු:

01. ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර, සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදාහැරීම් කටයුතු, සහ ග්‍රාම සංවර්ධන, අමාත්‍යතුමා (බ.ප) විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

"2013 මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝග සඳහා
<u>බස්නාහිර පළාතේ පළාත් සභාවේ අනුමැතිය ලබාගැනීම</u>"

"1991 අංක 07 දරණ බස්නාහිර පළාතේ මෝටර් වාහන ප්‍රඥප්තියේ 129 (1) වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදනු ලැබ, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1808/11 දරණ හා 2013 අප්‍රේල් මස 30 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද *"2013 මෝටර් වාහන ගාස්තු පිළිබඳ නියෝග"* යනුවෙන් හඳුන්වනු ලබන *'නියෝග'* බස්නාහිර පළාතේ පළාත් සභාව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි."

## XII. සභාව කල්තැබීම:

කේ.එච්.ඩී.කේ.සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2013.07.09 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහල, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.